# බළන්ගොඩ නගර සභාව

## 2021-12-14 වන දිනැති අයවැය සම්මත කිරීම සම්බන්ධ විශේෂ මහ සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.12.14**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.00 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් 2022 වර්ෂයේ අයවැය ලේඛනය සභාගත කිරීමේ විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා හා මාධ්‍යවේදීන් පිළිගත් අතර, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපතිතුමන් විසින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතට අනුව බළන්ගොඩ නගර සභාවේ 2022 වර්ෂයට අදාල අය වැය යෝජනාවලිය ගරු සභාවට ඉදිරිපත් කළ අතර, ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් එම අයවැය යෝජනාවලිය ස්ථිර කරන ලදී.

පෙ.ව 10.15 ට පමණ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා සභාව වෙත පැමිණෙන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් 2022 වර්ෂයේ අයවැය කතාව සභාවට ඉදිරිපත් කරන ලදී.

අයවැය කතාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතට අනුකූලව බළන්ගොඩ නගර සභාවේ 2022 වර්ෂයට අදාල අයවැය යෝජනාවලිය තමන් විසින් සභාගත කළ අතර, එම අයවැය යෝජනාවලියෙහි කිසියම් අඩුපාඩුවක් තිබේ නම් සංශෝධනයන් ලෙස එම අඩුපාඩු ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් අයවැය සඳහා සංශෝධනයක් ලෙස 2022 අයවැය සඳහා මන්ත්‍රී සංවර්ධන යෝජනා සඳහා වෙන්කර ඇති රු. 750,000.00 ක මුදල රුපියල් ලක්ෂ 10ක් දක්වා වැඩි කරන ලෙස යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එම අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු සංවිධායකතුමා හරහා ගරු සභා කටයුතු අධීක්ෂණය කිරීම සඳහා පළාත් සභාවෙන් නිළධාරීන් එවන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගෙන් කරන ලද ඉල්ලීමකට අනුව එම නිළධාරීන් පැමිණ සිටීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වන බව පැවසීය. එමෙන්ම ගරු සභාපතිතුමන් විසින් අයවැය කතාව අවසන් කළ පසු 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනත යටතේ සංශෝධන තිබේනම් ඉදිරිපත් කරන ලෙස පැවසූ නමුත් එම පනතේ 178 (අ) වගන්තියෙහි සංශෝධනය යනුවෙන් වචනයක් තිබේ නම් එය පෙන්වා දෙන ලෙස පවසන ලදී.

මෙහි දී පිළිතුරු ලබා දුන් ගරු සභාපතිතුමා, අයවැය යෝජනාවලියෙහි සුළු හෝ සම්පූර්ණ වෙනස්වීම් තිබේ නම් එය සංශෝධනයන් වශයෙන් සභාවට ඉදිරිපත් කළ යුතු බව පැවසීය.

නැවත වරක් අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා, මෙම පනත සකස් කර ඇත්තේ නීති විශාරදයන් බව ද පළාත් පාලන කොමසාරිස් හරහා ලිපියක් ලැබී ඇති අතර, එහි නීති විරෝධී ලෙස කටයුතු කර ඇති බව සඳහන්ව ඇතත් කෙදිනකවත් නීති විරෝධී ආකාරයට කටයුතු නොකළ බව ද නීත්‍යානුකූලව පනත අනුව වැඩ කිරීමට කැමති බව ද ගරු සභාපතිවරයාගේ වගකීම වන්නේ සභාව මෙහෙයවා අයවැය සම්මත කර ගැනීම බව ද සුළු

වශයෙන් වෙනස් කිරීම සංශෝධනයන් ලෙස අර්ථකථනය කිරීමට ගරු සභාපතිතුමන්ට හැකි නම් ඒ ගැන කතා කිරීමට තමන් ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට අයිතියක් පවතින බව ද පැවසූ අතර, සංශෝධනය යන වචනය පනතෙහි සඳහන්ව නැති බැවින් ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ගෙන ආ සංශෝධනයට තමන් විරුද්ධ බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා ස්ථිර කරන ලදී.

ගරු සභාපතිතුමා, පනතානුකූලව සියලු කටයුතු සිදු විය යුතු බැවින් යෝජනාව සඳහා බෙදීමකට යන්නේදැයි විමසන ලදී.

ඒ අනුව ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමා ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් ගෙන ආ යෝජනාවට බෙදීමක් අවශ්‍ය බවට යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ සඳහා අවශ්‍ය වන්නේ විවෘත ඡන්දයක්ද, රහස් ඡන්දයක්ද යන්න යෝජනා ස්ථිර කර ගන්නා ලෙස ගරු සභාපතිතුමන් විසින් ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

එහි දී විවෘත ඡන්දයකට යාම සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනී ජී. චන්ද්‍රලතා මැතිතුමිය ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022 අයවැය මඟින් මන්ත්‍රීතුමන්ලාගේ සංවර්ධන යෝජනා සඳහා වෙන් කළ රු. 750,000.00 ක මුදල ලක්ෂ 10 දක්වා වැඩි කිරීමට ගෙන ආ යෝජනාවට ප්‍රතිපක්ෂව යෝජනාවක් ගෙන ආ බැවින් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් හය දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 5 ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය යන අයත් |

විපක්ෂව සභිකවරුන් නව දෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රි | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රි | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රි | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රි | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |

8. ගරු නාගරික මන්ත්‍රිනි එම්. ශාන්තිලේඛා මැතිතුමිය
9. ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද

ඡන්දය ප්‍රකාශ කළ අතර, පහත සඳහන් සභිකවරුන් දෙදෙනා සභාවට නොපැමිණි ගරු සභිකයන් වේ.

1. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
2. ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා

ඒ අනුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් 2022 වර්ෂයේ අයවැය ලේඛනයට ගෙන එන ලද සංශෝධන යෝජනාව වැඩි ඡන්ද 03 කින් පරාජයට පත්විය.

මෙහි දී ගරු සභාපතිතුමා, වෙනත් සංශෝධන තිබේදැයි  විමසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී ගුණරත්න මැතිතුමා, 2022 අයවැය සම්බන්ධයෙන් සංශෝධන අවශ්‍ය නොවන බවට යෝජනා කළ අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව සඳහා බෙදීමක් අවශ්‍ය බවට ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

ඒ සඳහා විවෘත ඡන්දයක් සුදුසු බවට ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වන ලද ගරු සභාපතිතුමා, 2022 අයවැය ලේඛනයට සංශෝධන අවශ්‍ය නොවන බවට ගරු නාගරික මන්ත්‍රීවරුන් බෙදීමක් ඉල්ලා සිටිය අතර, එහි කිසිඳු ප්‍රශ්නයක් නොමැති බැවින් අයවැය ලේඛනයේ ගැටලුවක් නොමැති බවද සංශෝධන අවශ්‍ය නොවන බවට සියලුම දෙනා එකඟ වන බව ද එබැවින් බෙදීමක් අවශ්‍ය නොවන බව ද පැවසීය.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා, බෙදීමක් ඉල්ලූ විට බෙදීමක් ලබා දිය යුතු බව ද පනත අනුව ඒකමතිකව සම්මත වීමක් හෝ විරුද්ධ වන්නේ නම් බෙදීමක් දිය යුතු බව ද අයවැය ලේඛනය ගැටලුවක් නොවන බව එයින් නොකියවෙන බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා පැවසුවේ තමන් ඇතුළු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් පාලක පක්ෂය මිස විපක්ෂය නොවන බව පැවසීය.

මෙහි දී ගරු නාගරික මන්ත්‍ර ඩබ්. ඒ.ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ 2022 අයවැය සම්බන්ධයෙන් සංශෝධන දිගින් දිගටම අවශ්‍ය නොවන බවට යෝජනා කළ අතර, 178 (අ) වගන්තිය යටතේ සංශෝධන ලෙස සඳහන්ව නොමැති නිසා ගරු නාගරික මන්ත්‍රිනී

සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ගෙන ආ සංශෝධනයට විරුද්ධ වූ බව ද එම නිසා සංශෝධන අවශ්‍ය නොවන බවයි.

ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමන් අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමෙන් පසුව සංශෝධන ඉදිරිපත් වූ බව ද එහි දී එම සංශෝධනය ඡන්දයෙන් පරාජයට පත් කළ බව ද මෙම සභාව තුළ දිගින් දිගටම අයවැය සඳහා සංශෝධන ඉදිරිපත් කරමින් සභාව අර්ථවත් නොවන පරිදි පවත්වාගෙන යාමට විරුද්ධව බව ද පනතෙහි නොමැති කරුණක් ඉදිරිපත් කිරීම තේරුමක් නොවන බැවින් ඉදිරියටත් සංශෝධන ඉදිරිපත් නොකරන ලෙස මෙහි දී පැවසූ බව ද පවසන ලදී.

ඒ අනුව 2022 අයවැය සම්බන්ධයෙන් දිගින් දිගටම සංශෝධන අවශ්‍ය නොවන බවට ගෙන ආ යෝජනාවට බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම් වෙත දැනුම් දෙන ලදී.

මෙහිදී, එම යෝජනාවට පක්ෂව සභිකයින් දෙළොස් දෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 1. ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්. ටී. එම්. රූමි මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 9 ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රිනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

විපක්ෂව සභිකවරුන් තිදෙනෙකුද එනම්,

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 3. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය යන අය ද |

ඡන්දය ප්‍රකාශ කළ අතර, පහත සඳහන් සභිකවරුන් දෙදෙනා සභාවට නොපැමිණි ගරු සභිකයන් වේ.

| | |
|---|---|
| 1. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | කේ.ජී.පේමදාස මැතිතුමා |

ඒ අනුව 2022 අයවැය සම්බන්ධයෙන් දිගින් දිගටම සංශෝධන අවශ්‍ය නොවන බවට ගෙන ආ යෝජනාව වැඩි ඡන්ද 09 කින් සම්මත විය.

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් 2022 වර්ෂයට අදාලව අයවැය යෝජනා ලබා දෙන ලෙස 2021-09-20, 2021-10-12, සහ 2021-11-02 යන දිනැතිව සභාවේ සියළුම ගරු සභිකවරු වෙත මවිසින් දැනුම් දෙන ලද අතර, එකී දැනුම් දීමට අදාලව ගරු සභිකයන්ගෙන් ලද සංවර්ධන යෝජනා ද එසේම පුරවැසි කමිටුව මඟින් ඉදිරිපත් කරන ලද යෝජනා ද වෙනත් පුද්ගලයින්, සංවිධාන මඟින් ලද යෝජනා ද එසේම නගර සීමාව සිදු කරන ලද විවිධ ප්‍රචාරණ කටයුතු සිදු කිරීමෙන් ලද යෝජනා ද ඇතුලත් කරමින් නගර සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි සංවර්ධන යෝජනා ගලපමින් සමානාත්මතාව, සහභාගිත්ව සැලසුම් ක්‍රමවේද අනුගමනය කරමින් 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 178 වගන්තිය අනුව 2022 වර්ෂය වෙනුවෙන් මවිසින් සකස් කරන ලද අය වැය ලේඛණය අද දින එනම් 2021-12-14 වන දින ගරු සභාවට ඉදිරිපත් කළ බව පැවසීය. එමෙන්ම මවිසින් ඉදිරිපත් කරන ලද එකී අයවැය ලේඛණය කිසිදු සංශෝධනයක් සිදු නොකළ යුතු බවට ද එකී අයවැය ලේඛනයට දිගින් දිගටම සංශෝධනයන් සිදු නොකළ යුතු බවට ද සභාව විසින් ගෙනෙන ලද යෝජනා අනුව එකී අයවැය නිවැරදි වූ ද, සත්‍ය හා සාධාරණ වූද, පරිපූර්ණ අයවැයක් බව ගරු සභාව විසින් පිළිගෙන ඇති බව ද ඒ අනුව 255 වන අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 178 (අ) වගන්තිය සංශෝධනය කරමින් 2012 නොවැම්බර් 15 දාතමින් නිකුත් කරන ලද 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතේ 12 වන ඡේදය අනුව අයවැය ලේඛණයේ සියළුම විෂයයන් හෝ ඉන් යම් විෂයයක් හෝ සභාව විසින් සුළු වශයෙන් වෙනස් කරනු ලැබීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් හෝ ඊට යම් විෂයක් එකතු කිරීමක් හෝ සිදු නොවූ බැවින් මෙම අයවැය ලේඛණය සංශෝධන රහිත අයවැය ලේඛණයක් ලෙස සභාව විසින් පිළිගෙන ඇති බව ද ඒ අනුව 2022 වර්ෂය වෙනුවෙන් මවිසින් අද දින ඉදිරිපත් කරන ලද අයවැය ලේඛණය සභාවේ සම්මත කරන බව ද පැවසීය.

ඉන් අනතුරුව අද දින සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා මන්ත්‍රී මණ්ඩලය ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය කරමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.11ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.